### වර්ෂ 1947 නොවැම්බර් 15 වැනි දින පැවැත්වුණු

## පේරාදෙනියේ ගොවිකර්මාන්ත අභ්‍යාස විද්‍යාලයයේ සංවත්සරය දා

## ආචාර්ය රෙජිනල්ඩ් චයිල්ඩ් මහතා කළ කථාව.

---

ප්‍රාරම්භය: — හරියටම මීට අවුරුද්දකට පෙර මෙවැනි දවසක — 1947 නොවැම්බර් මස 15 වැනි දිනක — මා කොළඹදී කථාවක් පැවැත් වූ අවස්ථාවෙහිදී, මගේ කථාව ඉතිහාසය තසින් වැදගත් වුවත් වර්තමාන කාලයට නොගැලපෙන සිහින්හෙන් සංකල්පනය වූ බවක් — යල් පැනපු බවක් — මට පෙන්වා දෙන ලදී! එදා මා කථාවේදී සඳහන් කළ ඓතිහාසික සිඩිය වර්ෂ 1930 ට සීමා වූවකි.

එහෙත් එයින් — ඒ දෝෂ දර්ශනයෙන් — කම්පා නොවී, දූන් කරන්නට යන මේ කථාවට මීට වර්ෂ දෙසියයකට එපිටින් ඓතිහාසික සිඩියක් ගෙන හැර දක්වන්නෙමි. මා කියන්නට යන ඒ වගන්තිය ද යල් පැන ඇතැයි ඔබ සිතනොත් මම පුදුම වෙමි. ඒ වගන්තිය මෙසේ ය:—

> "ජාතියක් සම්බන්ධයෙන් හෝ වේවා පුද්ගලයෙක් සම්බන්ධයෙන් හෝ වේවා, ප්‍රථම ආශීර්වාදය නම් නිදහස යි. ජීවිතයේ අවශ්‍යකම් හා සුව පහසු කම් කිසියම් බලයක් විසින් මනා දමන මිනිසෙකුට හෝ ජාතියකට නියම ප්‍රීතියක් ඇති විය නොහැකියි. පිටත්තර උපකාරයෙන් විරහිතව ජීවත් විය හැකි මාර්ගයක් නැත. අපේම පරිශ්‍රමයෙන් දියුණු කරන ලද අපේම දේශයේ නිපදවන දූයින් අපේ දියුණුව ඇතිකර ගත යුතුය. සෙසු හැම මාර්ගයක්ම අස්ථිරය."

මේ වාක්‍යය අද දින ඩේලි නිවුස් පත්‍රයේ කතු වැකියෙහි තිබුණි නම් ඔබ පුදුම නොවෙති යි සිතමි. එහෙත් එය පළ වූ යේ වර්ෂ 1756 යේ මාර්තු මාසයෙහි පළවූ "ද විසිටර්" නම් ඉංග්‍රීසි සඟරාවේ තුන් වැනි පිටුවේ ය. ලේඛකයා ආචාර්ය සැමුවල් ජොන්සන් ය.

වර්ෂ 1756 යේ දී එංගලන්තයේ හා වේල්ස්හි ජනගහනය අද ලංකාවේ ජනගහනයට වඩා වැඩි වුණා නම් ඒ ඉතා සුළුපයකිනි. එම ජනගහනයෙන් ලන්ඩන් නුවර විසූ දහයෙන් පංගුව හැර සෙස්සෝ ගම් වැසියෝම වූ හ. එකල එංගලන්තයේ වෙළහෙළඳාම දියුණුව පැවැති නමුත් කර්මාන්ත විප්ලවය ඒ වනතුරු නොපැමිණි විරූය. වෙළෙහෙළඳාම වලින් රටක් දියුණු කළ නොහැකි යයි ආචාර්ය ජොන්සන් මොහොතකට වත් කල්පනා නොකෙළේය. එහෙත් "පොළොව සාරවත් කිරීම සඳහා මගේ හැම රටවැසියෙක්ම සෙසු හැම රක්ෂාවක්ම අත්හැර දූමිය යුතුය" යි හෙතෙම හඬ ගෑවේ ය. රටක ස්ථිර අභිවෘද්ධියේ මුල් පදනම ගොවිකර්මාන්තය යි.

ශත වර්ෂයක පසු එංගලන්තයේ ජනගහනය බොහෝ ලෙසින් වැඩි විය. පිට රටින් ගෙන්වූ ආහාර ද්‍රව්‍යවලට ගෙවීම සඳහා වෙළඳ බඩු පිට රට පැටවීම විශාල වශයෙන් කෙරිණ. වෙළහෙළඳාමටම දිවි දීම හේතුකොටගෙන 1846-1931 යන කාලයන්හි එංගලන්තයේ ගොවිකර්මාන්තය වැටී තිබුණු තත්වය සම්බන්ධයෙන් වර්ෂ 1942කේ දී ආචාර්ය සී. ඇස්. ඕවින් විසින් කරන ලද ප්‍රකාශයක් මෙහි ඇද දැක්විය හැකිය :—

> "බ්‍රිතානියේ ගොවිකර්මාන්තය දියුණු කිරීමට උත්සාහ දරන්නේ කුමකට ද ? එය මූකලී කම්කරුවන්ගේ දහඩිය පෙරන රක්ෂාවකි. ධනපතියන් සම්බන්ධයෙනුදු එය වැඩි ලාභ දෙන වැඩක් නොවේ. අපේ රටේ නිපදවන බඩු යවන රටවලින් අපේ යැපීමට අවශ්‍ය හැම දෙයක්ම ගත හැකිය. ඉදින් ගොවිකර්මාන්තයෙන් ඇති ඵලය කුමක් ද ?"

ඉංග්‍රීසීන්ගේ ගොවි කර්මාන්තය පසකට හෙළා, ගොවිකර්මාන්තයට විශේෂ ස්ථානයක් නොදෙන, ආර්ථික ජීවිතයක අමිහිරි ආදීනව දැනගන්නට පසු ගිය ලෝක මහා සංග්‍රාම දෙක හොඳටම ඇත.

ලංකාව හා එබඳු උෂ්ණ කලාපික රටවල ආර්ථික තත්වයේ දුර්වලකම් අපට පෙනීයන්නේ ත්, යුද්ධයක් හෝ ධන පරිහානියක් පැමිණි අවදියෙහි ය. රටේ නිපදවන බඩු භාණ්ඩාදිය පිට රට යවා පිට රටින් ආහාර ද්‍රව්‍ය ගෙන්වීම් සංඛ්‍යාත ක්‍රමයකින් සැකසුණු ආර්ථික ක්‍රමයක අඩුලුහුඬු තම යස රඟට හෙළි විය. ලංකාවේ නිපදවන ද්‍රව්‍යයන්ගේ විවිධතාවය හේතු කොට එබඳු පරිහානි සමයන්හි දී මේ විපය බරපතල ලෙසම කෙළෙත්තාඩු නොවූ නමුත්, එයට එතරම් නිදහසක් නොලැබුණු බව නම් පිළිගත යුතුය.

ගොවිකර්මාන්තය කිරීම සඳහා අන් හැම කර්මාන්තයක්ම අත්හැරිය යුතුය යි, ආචාර්ය ජොන්සන් මෙන්ම මමත් කියමි. එහෙත් ගොවිකර්මාන්තය යනුවෙන් මා අදහස් කරන්නේ වී වැපිරීම හෝ උක් වැවීම ආදී ලඝු කටයුතුම නොවේ. ගොවිකර්මාන්තය සඳහා සෙසු සකල කර්මාන්තයක්ම සම්පූර්ණයෙන්ම නැවැත්විය යුතුය යි — සුළු වශයෙන් වත් නොකළ යුතුය යි — මම අදහස් නොකරමි. ගොවි කර්මාන්තයට ඉතා උසස්තැන දී සෙසු කර්මාන්ත ද ඒවාට සරිලන සුදුසු තත්වයකට තබා ගැනීම ය, රටක ආර්ථික දියුණුවක් ඇතිකර ගැනීමට උපයෝග වන්නේ.

පොල් කර්මාන්තය :— මගේ කර්මාන්තය ගැනම කරුණු ටිකක් කියන්නට බලාපොරොත්තු වෙමි. පිටරට පැටවීමය — ආහාරයට ගැනීමය. යන විප්‍රකාර ප්‍රයෝජනයකට පාත්‍ර වන වැවීමකි — කර්මාන්තයකි — පොල් කර්මාන්තය. ලංකාවේ වැවෙන පොල් වලින් හරියටම දෙකෙන් කොටසක් පමණ (නොයෙක් ස්වරූපයෙන්) ලංකාව ඇතුළේම පාවිච්චියට ගැනෙනබව ගණන් බලාතිබේ. රටේ ප්‍රයෝජනය සඳහා පොල් ගැනෙන බව, වෙළඳ වාර්තාවන්හි සඳහන් නොවන නිසාදෝ, එය සාමාන්‍යයෙන් අමතක වී තිබේ. එහෙත් ලංකාවේ ආහාරයට ගැනෙන පොල්වල මිල බලනු. එය අවුරුද්දකට රුපියල් අට කෝටියක් පමණ

වෙතැයි සලකනු ලැබේ. ඒ සඳහා ගිය මුදල පසු ගිය අවුරුද්දේ ලංකාවට ගෙන්වනු ලැබූ හාල් ගොණිබර පණස් ලක්ෂයට වැඩි ය.

මනුෂ්‍යයා ඇතුළු හැම සත්‍වයකුගේම ආහාරයෙහි මාංශධාතුව, ආහාරධාතුව හා තෛලමය ධාතුව අග තැන් ගන්නා බව මෙහි විද්‍යාර්ථීන්ට අමුතුවෙන් කියුව මනා නොවේ. බොහෝ යුරෝපා රටවල් හා ඇමෙරිකා එක්සත් ජනපදය තෙල් පිටරටවලින් ගෙන්වන්නෝ වෙති. එහෙත් ලංකාව ඒ අතින් ස්වයං පෝෂිත ය. ලංකාවේ ආහාරයට අවශ්‍ය හැම තෛලමය ධාතුවක්ම පොල් ගසින් සම්පාදනය වේ (එහෙත් ආහාර ධාතුව සම්බන්ධයෙන් එය එසේ නොවේ) වර්ෂ 1938 දී අපි රුපියල් පස් කෝටියකට වඩා වියදම් කොට හාල් ටොන් 5.20 000 ක් පිටරටින් ගෙන්වීමු. රුපියල් අට කෝටියකට වඩා වියදම් කොට සීනි ටොන් 7,50,000 පිටරටින් ගෙන්වීමු. හාල් හැර සෙසු ධාන්‍ය වගී සුළු කොටසක් පිටරටින් ගෙන්වීමු. වර්ෂ 1946 යේ දී, රුපියල් හැට කෝටි පනස් ලක්ෂයක්ට වඩා වියදම් කොට හාල් ටොන් 2,50,000 කුත්, පස් කෝටියකට වඩා වියදම්කොට පිටි ටොන් 200,000කුත්, තුන් කෝටි අසූ ලක්ෂයකට වඩා වියදම්කොට සීනි ටොන් 90,000කුත් ගෙන්වා ගතිමු. මෙසේ බලන විට ආහාර රසයේ 'බිල'— වියදම — රුපියල් පසළොස් කෝටියක් පමණ වේ.

පර්යේෂණ — ලංකාවේ ආර්ථික ජීවිතය සම්බන්ධයෙන් ගොවිකර්මාන්තය බලපවත්වන සැටි වැඩිදුරට විස්තර කිරීම මගේ පරමාර්ථය නොවේ. මෙහි ශිෂ්‍යයන්ගේ කටයුතු, ගොවිකර්මාන්තයේ උන්නතිය සම්බන්ධයෙන් බලපවත්වන සැටි පමණක් ලුහුඬින් ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

"විද්‍යාව වනාහී ප්‍රතිපත්තිය හැඩ ගැස්වීමේ අත්‍යාවශ්‍ය ආයුධයකි" යනු ප්‍රකට ප්‍රකාශයකි — කීමකි.

පිටරට යැවීම පිණිස අප විසින් නිපදවනු ලබන ද්‍රව්‍ය සඳහා තියුණු තරඟයක් පවතී නිපදවන ද්‍රව්‍යයන්ගෙන් ලාභ ප්‍රයෝජන ගන්නට නම් තරඟයෙන් ජය ගත යුතුය. ඒ සඳහා නිපදවන ද්‍රව්‍යයන්හි උසස් බවක් ඇති විය යුතු මැය්. මේ උසස් බව ඇති කරලීම සඳහා ආණ්ඩුව මගින් පිහිටුවන ආයතන වලින් ඒ ඒ ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ පැවැත්වීම, හොඳ අවබෝධයක් ඇති කර දීම, උපදෙස් දීම, ආදිය කරනු ලැබේ.

එතකුදු වුවත්, මේ කාරණත්‍රයෙන් පළමු වැන්නවූ පර්යේෂණ පැවැත්වීම ගැන මේ සංඛ්‍යාවෙහිදී වැඩිමනත් කරුණු කීමට මම බලාපොරොත්තු නොවෙමි. කවර හෙයින් ද යත් ලංකාවේ පර්යේෂණ නැදර්ලන්තයේ - ඉන්දියා දිවයින් - ආදියේ පර්යේෂණ තත්‍වයට වඩා උසස් තත්‍වයක් භජනය කරන හෙයිනි. ලංකාව වැනි පොඩි රටක, ගොවිකර්මාන්ත දෙපාර්තමේන්තුව හා අපේ සෙසු ආයතන තුන කරන වැඩ සුළුපටු නොවේ.

විද්‍යානුකූල පර්යේෂණය කොතරම් වැදගත් හෝ වේවා, නිපදවන්නන් හට නවීනතම — ඉතා අලුත් විද්‍යානුකූල දැනීමක් උපදේශයක් ලබා නොදී කෙරෙන පර්යේෂණය එතරම් ඵලදායක නොවන්නේය. ප්‍රධාන වශයෙන් මා කථාකරන්නට බලාපොරොත්තුවන්නේ මෙන්න මේ කාරණය ගැනය.

හැරත් ඔබගේ ප්‍රධානාචාර්යතුමා, අද දින මෙහි කථාවක් කරන්නට යයි ඉතා කරුණා බරව ආරාධනා කළ වේලේ කියා සිටියේ "ශිෂ්‍යයන්ට උපදෙස් වචනයක් හා ධෛර්යයක්" දෙන ලෙසය. උපදෙස් වචනයක් පසුව එයි. ධෛර්යදීමක් වශයෙන් මට කියන්නට ඇත්තේ, යුෂ්මතුන් ඉදිරියේ ඇති ඉගෙණීම හා වෙනත් කටයුතු මතු අනාගතයේදී ලංකාවේ යසස් සෞභාග්‍යය සඳහා පවතින බවය. මේ කටයුතු මා සිතන හැටියට හැඳින්විය යුතුව තිබෙන්නේ "විශාල කිරීමේ කටයුතු" හැටියට ය. ගොවි කර්මාන්තය සම්බන්ධ පරීක්ෂණ පැවැත්වීමෙන් පසු සොයාගනු ලබන විශිෂ්ඨ ක්‍රම, අධ්‍යාපනයේ මාර්ගයෙන්ම ප්‍රචාරය විය යුතුය. නීති මගින් කළ යුතුවූ කටයුතු ඇතිවූ විට - නිදර්ශනයක් වශයෙන් දක්වතොත් පස් සොධායාම, පැලෑටි කෘමින් සහ රෝග පිළිබඳව ව්‍යවස්ථා පණවා ගන්නට වුවමනාවූවිට - එයට අධ්‍යාපනයම පෙරදූරි කර ගත යුතුයි. පණත ව්‍යවස්ථාගත කරවා ගැනීමේ අවශ්‍යතාවය නිරායාසයෙන්ම අවබෝධ වන්නේ එවිට ය.

විශාල කිරීමේ වැඩ :—

(a) <u>විශාල ක්‍රමයේ වැඩ:</u> වතු වැවීමේදී විශේෂඥයන්ගේ පර්යේෂණ ප්‍රතිඵල ක්‍රියාවේ යොදවන්නට පොහොසත්කම ඇති විශාල වැවිලි සම්බන්ධයෙන් සංවර්ධිත ගොවිකර්මාන්ත ක්‍රම ක්‍රියාවේ යෙදවිය හැකිය. වතු ක්‍රම අතින් ලංකාවේ පර්යේෂන ආයතනයන්හි වැඩ කටයුතු බොහෝ සේ සාර්ථක වී ඇති බව කිය යුතුය. වතුකාර සංගම් ඇති වීම, විශාල වැවිලි කරුවන් එක් තැන් කරවීමට කදිම මාර්ගයක් වී තිබේ. එසේ, එක් තැන් වන වැවිලි කරුවන් හට, කථා මාර්ගයෙන් හා සාකච්ඡා මාර්ගයෙන් වැවීම පිළිබඳ අභිනව අත්දැකුම්, අභිනව පර්යේෂණ ප්‍රතිඵල කියා දීමට පර්යේෂණ නිලධාරීන්ට පුළුවන් වන්නේ ය.

නිදර්ශනයක් වශයෙන්, 'පොහොර කොටස් කිරීමේ ව්‍යාපාරය' පිළිබඳ ගුණදෝෂ විචාරණ කීපයක් මා අසා තිබේ. වර්ෂ 1942 දී ආරම්භ කරන ලද එය වූකලී වැවිලිකරු හා වෙළඳ සමාගමයන්ගේත්, පර්යේෂණ ආයතනයන්ගේ හා ගොවිකර්මාන්ත දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේත්, පොහොර සම්පාදනය කරන වෙළඳ සමාගමයන්ගේ හා පාලකයන්ගේත් සහයෝගයෙන් හා සමූපකාරයෙන් පිහිටුවා ගන්නා ලද්දකි.

(b) <u>සුළු ක්‍රමයේ වැඩ:</u> කුඩා ක්‍රමයේ වැවිලි සම්බන්ධයෙන් කල්පනා කර බලන විට සංවර්ධිත ගොවිකර්මාන්ත ක්‍රම ක්‍රියාවේ යෙදවීම අතිශයින් අසීරු කාරණයකි. කුඩා වතු හිමියන්හට කෘෂිකාර්මික විශේෂඥයන් පහසුවෙන් ලබා ගත නොහැකිය. ලබාගත හැකි වන්නේ මනාසේ පුහුණු කරන ලද ගොවිකම් උපදේශකයා හෝ සුලු - ඉඩම් - නිලධාරියා ය. විශේෂඥයන්ගේ මත, ඔවුන්ගේ විශේෂ සොයා ගැනීම්, තමන්ගේ බසින් සුළු හිමියන්ට කියාදීම ඔවුන් සතු යුතු කම ය. එහෙත් නොපැහැදිලි කරුණ නොව පැහැදිලි කරුණම නැවත නැවතත් කියා දෙන්නට ඔහුට සිදුවන අවස්ථා බොහෝය.

ගොවිකම් උපදේශකයාගේ කාර්යය එතරම් පහසු නොවේ. ඔහුගේ කාර්යයේ සඵලභාවය රඳා පවත්නේ, ඔහුගේ ප්‍රදේශයේ කාර්යශීලත්වය ඇතිකිරීමට ඔහු

ගන්නා ආයාසය උඩ ය. මේ අලුත් ක්‍රම ක්‍රියාවේ යෙදවිය හැක්කේ, දැනට කරන පිළිවෙළට වඩා මේ අලුත් පිළිවෙළ හොඳය යි උපදේශකයා විසින් සුළු ඉඩම් හිමියාට පෙන්වා දීමෙන් පසුව ය. සුළු ගොවියෝ වනාහි අලුත් ක්‍රමවලට ස්වභාවයෙන්ම නැති ගන්නාහු වෙති. සුළු බිම් කැලි වවා පෙන්වීම ද එතරම් සාර්ථක විය හැකි නොවේ. සුළු ඉඩම් වවා ආදර්ශයක් දැක්වීම වඩා ඵලදායක වන්නට පුළුවන.

එහෙත් ප්‍රධාන ප්‍රතිපත්තිය වියයුත්තේ සාමූහික වැඩපිළිවෙළට අනුබලදීමයි. තනි පුද්ගලයන් වශයෙන් ගෙන අලුත් ගොවිකර්මාන්ත ක්‍රම සුළු ඉඩම් හිමියන්ට කියා දීම අතිශයින් අපහසුය. ලංකාවේ පොල් වවන්නන් අතුරෙන් වැඩි සංඛ්‍යාවක් සුළු ඉඩම් හිමියන් වුව ද, ඔවුන්ට කරුණු කියා දීම සම්බන්ධයෙන් උපයෝග කරගත හැකි සමිතියක් — සංස්ථාවක්, මේ මෑතක් වන තුරුම පොල් පරීක්ෂක සභාවට නොතිබුණේය. මෙය මෙසේ වූ යේ සුළු ඉඩම් පිළිබඳ නිලධාරීන් කෙසේ කටයුතු කළ යුතු දැයි සිතා මතා ගන්නට පොල් පරීක්ෂක සභාවට නොහැකි වූ නිසාය. සමුපකාර සමිති හා කරණ ලද සාකච්ඡාවකින් පසු, ඒ සඳහා සුදුසු ප්‍රතිකර්මයක් අප විසින් සොයා ගෙන තිබේ.

පොල් විකිණීම පිළිබඳ සමුපකාර සමිති ආසන්නයෙහි පිහිටි පොල් වැවෙන ප්‍රදේශයන්හි පොල් තවාන් ගණනක් ඇති කිරීමට අප විසින් විධිවිධාන යොදාගෙන යනු ලැබේ. අපේ පරිපාලනය යටතේ එම සමිති මගින් පොල් තවාන් සිටුවනු ලැබේ. එසේම මෙම සමිති සඳහා ලාභ ලෙසත් පහසු ලෙසත් පොහොර සම්පාදනය කිරීමට සමුපකාර කාර්යාංශය කටයුතු පිළියෙළ කොට තිබේ. පොහොර දැමීම පැළ සිටුවීම ආදිය පිළිබඳ උපදේශ අපේ ගොවිකම් නිලධාරීන් හා උප නිලධාරීන් විසින් දෙනවා ඇත. මේ ක්‍රමය සාර්ථක වන බව පෙනී ගියහොත් මේ කාර්යය සඳහා උප නිලධාරීන් කීප දෙනෙකු වුවද පත් කරන්නට විධිවිධාන යෙදිය හැකිය.

තවද, ආහාර නිෂ්පාදනය පිණිස, ගොවිකම් සමුපකාර සමිති විශේෂයක් පිහිටුවන්නට ලංකාණ්ඩුව තීරණය කරගත් බවක් මේ සතියේ පුවත් පත් මගින් ට දකින්නට ලැබුණේය. මේ සමිතිවල කාර්යාධිකාරී ලේකම්වරුන් වශයෙන් ආහාර නිෂ්පාදන නිලධාරීන් හා ඕවර්සියර් වරුන් ද පත්කරන්නට යන බව සැලසි.

ශිෂ්‍යයන්ගේ අනාගතය : ගොවිකර්මාන්ත සංවිධානය හා ප්‍රතිපත්තිය සම්බන්ධව තවත් කරුණු කියන්නට යාමෙන් මා සීමාව ඈත ගියාදෝහෝයි සිතමි. මගේ ප්‍රතිපත්තිය වූ යේ, යුෂ්මතුන්ගේ අධ්‍යාපනය හා යුෂ්මතුන්ගේ අනාගතය, අපේ ගොවිකම් ප්‍රතිපත්තිය හා ගැලපෙන පරිද්දෙන් කරුණු ටිකක් කෙටියෙන් විදහා දැක්වීම ය.

නුදුරු අනාගතයේදී යුෂ්මතුන්ගෙන් සමහර දෙනෙක් ගොවිකම් දෙපාර්තමේන්තුවේ වැඩ බලකරන්නන් (foremen) වශයෙන් හා පරීක්ෂණ ආයතනයෙහි උප නිලධාරීන් වශයෙන් හෝ කාර්යයෙහි යෙදෙනවා ඇත. පොල් පරීක්ෂණ

ආයතනයෙහි දැනටමත් මෙම විද්‍යාලයයේ ආදි ශිෂ්‍යයෝ සතර දෙනෙක් සිටිති. තවත් මතුවට බලාපොරොත්තු වෙමු.

යුෂ්මතුන්ගේ බොහෝ දෙන, "විශාල කිරීමේ කටයුතු" නමින් මා හඳුන්වන කාර්‍යයෙහි ගොවිකම් උපදේශකවරුන් වශයෙන් යෙදෙන්නට පුළුවන.

සාමාන්‍ය ශිෂ්‍යයන් අතුරෙන් ඇතැමෙකු ස්වකීය වතුපිටි පිළිබඳ පරිපාලන (සුපිරින්ටැන්ඩන්ට්) ධුරයන්හි යෙදෙන්නට පුළුවන. එසේ යෙදෙන යුෂ්මතුන් මෙරට අනාගත ගොවිකර්මාන්ත උන්නතිය සම්බන්ධයෙන් සිදු වන මෙහෙය රජයේ නිලධාරීන් ගෙන් සිදුවන මෙහෙයට කිසිසේත් අඩුය යි මොහොතකටවත් නොසිතිය යුතුයි. මහා බ්‍රිතාන්‍යයේ කෘෂිකර්මාන්තය පිළිබඳව ඇතිවූ ආදීම උන්නතිය ආණ්ඩුවේ ක්‍රියා කලාපයෙන් සිදුවූවක් නොවන බව මම ඔබ හමුවේ පවසනු කැමැත්තෙමි. ඒ ගොවිකර්මාන්ත දියුණුව ඇතිවූයේ "ටර්නිප්" "ටවුන් ෂෙන්ඩ්" "කුක්" ආදි ඉඩම් හිමියන් නිසා ය. රොබර්ට් බේක්වෙල්, චාර්ල්ස් කොලින් ආදී උද්‍යෝගවත් ගොවියන් නිසා ය. ජෝන් ඇන්ඩෲස් වැනි ඥානවන්ත රට වැසියන් නිසා ය.

ගොවිකර්මාන්තය දියුණු කරලීම විශෙෂඥයින් හා ආණ්ඩුවේ නිලධාරීන් අතේ පවත්නා දෙයකැයි බොහෝ දෙනා කල්පනා කරන බව පෙනේ. එහෙත් එය එසේ නොවේ. එදට වැඩියෙන් මෙද ගොවිකර්මාන්ත පර්යේෂණය විශෙෂඥයන්ට උරුම වී තිබෙන බව රහසක් නොවේ. එහෙත් ගොවිකම් වගාව, පලදාව වැඩිකර ගැනීම ආදිය සාමාන්‍ය ගොවියාගේ - උනන්දුවෙන් - සහයෝගයෙන් උපකාරයෙන් - තොරව කිසි ලෙසකින් කර ගත නොහැක්කේ ය. කර්මාන්ත සම්බන්ධයෙන් විශෙෂයෙන් නිදර්ශනයක් වශයෙන් කියතහොත් සත්ව පාලනය සම්බන්ධ හෝ වඩා විශාල ප්‍රතිඵල ලැබිය හැක්කේ ගම්බද සාමාන්‍ය ගොවියාට ය. තවමත් නවහායා ඉදිරියෙහි ගොවිකර්මාන්ත උන්නතියේ වාරය විවෘත වී ඇත්තේ ය.

දැන් පලකරනු ලබන (Tropical Agriculturist) සඟරාවේ කලාප එකී පැරණි කලාප හා සසඳා බැලීම වටනේය. එය අද සර්ව සම්පූර්ණ විද්‍යානුකූල සඟරාවකි. පර්යේෂණ නිලධාරීන්ගේ ලිපි, දෙපාර්තමේන්තු චක්‍ර ලේඛන, කාර්‍යාලයීය සභා රැස්වීම් වාර්තා, සහ ඇතැම්විට වෙනත් සංග්‍රහවලින් උපුටා ගන්නා ලද ලිපි ලේඛනාදියෙන් ඒ සඟරාව දැන් පරිපූර්ණය. වර්ෂ 904-1920 අතරතුර කාලයේ සඟරාවේ නමට "ලංකා ගොවිකර්මාන්ත සමිතියේ සඟරාව" යන්න ද ඇතුලත් විය. ඒ කාලයේ සඟරාව විද්‍යානුකූල මුහුණුවරින් දැනට වඩා අඩු විය. එකල ලියුම් කාරුවන්ගේ තීරය ප්‍රසාද ජනක වාද විවාද වලින් පණ ගැහුවේය. වැවිලි කරුවන්ගේ සහ වෙනත් පාඨකයන්ගේ ලිපිවලින් රසවත් විය. මගේ කල්පනාවේ හැටියට සඟරාවක් සර්ව සම්පූර්ණත්වයෙන් විද්‍යානුකූල සඟරාවක් ලෙසට පැවැත්වීම අපහසු ය.

වැවිලි පිළිබඳ විශෙෂ ඥානය: එක් වැවිල්ලක් පිළිබඳ විශෙෂ ඥානයක් ලබා ගැනීම පිණිස වතුවල කළමනාකාර පදවි වලට යන්නවුන් ගැන මදක් සිත මෙහෙය වීම වටී. එක් වැවීමක් පිළිබඳ අතිරේක ඥානයක් ලබා ගැනීම, ගොවි-

කර්මාන්තය සම්බන්ධයෙන් ලබන ලද ක්‍රමවත් වූ නිර්මල වූ අධ්‍යාපනයකින් පුළුවන. පිටරට යවන ප්‍රධාන වැවිලි තුන සම්බන්ධයෙන් නම් ඊටත් වඩා විශේෂ ඥානයක් ලබා ගන්නට පුළුවන.

අමාත්‍යවරයාගේ උපදේශය පරිදි, පර්යේෂණ ආයතනයන්හි පුහුණුව ලබනු සඳහා ශිෂ්‍යයන්ට ඉඩකඩ ලබා දෙනු ලබන බව එම ආයතන පිළිබඳ ව්‍යවස්ථාවන්හි සඳහන් වේ. එහෙත් ඒ අතින් සිදුවී තිබෙන වැඩක් නැත. පර්යේෂණ ශිෂ්‍යත්වයක් පිහිටුවන්නට පොල් පරීක්ෂක සභාව උත්සාහ කළ නමුත් එය ව්‍යර්ථ විය.

අපේ වතුවලට (පඩි නොගෙවන) වැඩ ඉගෙන ගන්නා තැනැත්තන් දෙදෙනෙකු බැගින් පත් කිරීමට අපේ පාලක සභාව මෑතදී තීරණය කරගෙන තිබේ. මේ වැඩ ඉගෙන ගන්නා ශිෂ්‍යයන් 'වැල්' හැටියට (creepers) හෝ 'බඩගා යන්නන්' හැටියට පාලක සභා වාර්තාවේහි සඳහන් කර තිබීම ඉතා කනගාටුදායක වුවත්, මේ අත්හදා බැලීම සාර්ථක වේයයි බලාපොරොත්තු වෙමු.

අවුරුද්දකට වරක්, පර්යේෂණ ආයතනයට අවසාන වසරේ ශිෂ්‍යයෝ පිළිගනු ලැබෙත්. ගොවිකර්මාන්ත විද්‍යාලය හා සංසන්දනය කොට මීට වඩා යමක් කිරීමට මම බලාපොරොත්තු වෙමි. ශිෂ්‍යයන් හට සතින් සල විශේෂ මාතෘකාවක් යටතේ අපේ පර්යේෂණ නිලධාරීන් ලවා විශේෂ කථාවක් පවත්වන්නට පිළියෙල කර දුනීම ප්‍රඥාගෝචර විය හැකිය. මෙහි ශිෂ්‍යයන් පාඩම් පංතිය පරිපූර්ණ එකක් බව මට පෙනේ. විශේෂ කථාවකුත් ඒ පිටට පැවැත්වීමෙන් ඔවුන්ට අවහිරයක් වයි නම්, මා ශිෂ්‍යයන්ගේ අනුකම්පාව ලැබිය යුත්තෙක්මි! පසුගිය වසරේ යුෂ්මතුන්ගේ විද්‍යාලයාධිපති තුමා, අපේ පාලක සභාවේ සභාපතිත්වය දැරූ ගොවි-කර්මාන්ත අධ්‍යක්ෂක තුමාගෙන් දැනගන්නට ඕනෑ කෙළේ විද්‍යාලයේ පුහුණුව අවසාන කරන්නට පෙරාතුව අවසාන වසරේ ශිෂ්‍යයන්ට පර්යේෂණ ආයතනයේ කෙටි කලක් පර්යේෂණ පවත්වන්නට ඉඩ දෙන්නට පුළුවන්ද? යන බවය. අපේ පාලක සභාව එම ආරාධනය ඉවසූ නමුත්, ඉඩ කඩ ප්‍රශ්නය නිසා ඉල්ලීම ඉටු කළ නොහැකිය. බණ්ඩිරුප්පුව රත්මල පාර යන වතු අසල ගොඩනැගිලි විරලය. එහෙත් අප අත තිබෙන මුදල් තත්වය අනුව එයට ප්‍රතිකාර යොදන්නට සිතාගෙන සිටිමු.

අවසානයේ: ගොවිකර්මාන්ත (අභ්‍යාස) විද්‍යාලය මුළු දිවයිනේම සැලකිල්ලට භාජන වී තිබෙන්නක් බව ප්‍රකට කාරණයකි. මෙහි ඉගෙනීම ලත් ශිෂ්‍යයන් අතුරෙන් (සතර දෙනෙකු ගොවිකර්මාන්තයෙන් පාර්ලිමේන්තුව ඇතුළත් වී සිටින නමුදු) හැම දෙනෙකුම ගොවිකර්මාන්තයෙහි නියැලී සිටින බව යුෂ්මතුන්ගේ ප්‍රධානාචාර්යතුමාගේ වාර්තාවෙන් හෙළි වී තිබීම ප්‍රසාද ජනකය. අද දින ත්‍යාග දිනූ හැම දෙනෙකුට මගේ ප්‍රීතිය ප්‍රකාශ කරමින්, විභාගයන්ගෙන් සමත් වූ සියලු දෙනාහට මතු අනාගතය සාරවත් වේවායි ආශීර්වාද කරමි. ඔවුන් ගෙන් සමහර දෙනෙකු මට බණ්ඩිරිප්පුවේ දී දකින්නට ලැබේ යයි සිතමි. මෙහි එක් අවවාදයක් කියන්නට මට සිත් වෙයි. ඒ වනාහි රක්ෂාව ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ලියන පිළිවෙළ ගැනය. රැකී රක්ෂා විරහිත කම ගැන දිනක් එක්තරා අමාත්‍යවරයකු

සමග කථාවක යෙදී සිටියදී, වර්‍ෂ 1937 එක්තරා ලිපිකරු ඇබෑර්තුවක් සඳහා ඉල්ලුම් පත්‍ර කාණ්ඩයක් ලැබුණු බව, රැකී රක්‍ෂා දුර්ලභත්‍වයට නිදර්‍ශනයක් වශයෙන් මම කීවෙමි. එ තරම් ඉල්ලුම් පත්‍ර රාශියකින් එකක් තෝරා ගත්තේ කෙසේ දැයි ඇමැතිවරයා ඇසීය. මම මෙසේ කීමි:

"පළමු කොටම මට 'ගරුකටයුතු මැතිතුමනි' යනුවෙන් අමතා තිබුණු ඉල්ලුම් පත්‍ර අඟකාට දැමීමි; දම්පාට තීන්තෙන්, කොළ පාට තීන්තෙන් ලියා තිබුණු ඉල්ලුම් පත්‍ර ඊළඟට අහකට වීසි කෙළෙමි. ඊළඟට රාජ්‍ය මන්ත්‍රීන්ගෙන් විශේෂයෙන් ඇමැතිවරුන්ගෙන් සහතික පත්‍ර අමුනා තිබූ ඉල්ලුම් පත්‍ර අහකට දැමීමි."

පසුව කී කරුණ කීවේ විහිලුවට ය. එහෙත්, ඇත්තක් කියමි: ඉල්ලුම් පත්‍රයක් ලියන විට හොඳ කරදාසියක හොඳ තීන්තෙන් හොඳ අත් අකුරෙන් ලියන්ටත්, නැතහොත් ටයිප් ගසන්ටත්, උගත් කම් ආදිය (වයස අමතක නොකර) පැහැදිලි ලෙස සටහන් කරන්නට අමතක නොකළ යුතුයි.

අද දින ඔබ හමුවේ කථා කරන්නට ආරාධනා කළ විද්‍යාලයාධිපති තුමන්ටත් කථාව අසාගෙන සිටි ඔබටත් මවිසින් ස්තුති කටයුතු ය. එහෙත් බොහෝ විට, කථාවක් අවසන් කරන විට, 'අමාරු ගරිය තව ආවේ නැත' යන බර කල්පනාව ශ්‍රෝතෘන්ගේ සිතට එයි. මක් නිසා ද, 'කථිකයා මහතාගෙන් ප්‍රශ්න අසන්නට දැන් වේලාව පැමිණ තිබේ ය'යි කීම මූලාසනයේ (බොහෝ විට) සිරිත වී ඇති හෙයිනි. එබඳු අවස්ථාවක් වූ විට කැමැත්තට වඩා අකමැත්තව බර වී මම හිස වනන්නෙමි. එසේ කුදු වුවත් අන්න ඒ අමාරුවෙන් මා අද මුදනු ලැබේ යයි විශ්වාස කරමින් මගේ කථාව අවසන් කරමි. එහෙත් අවසානයට මත්තෙන්, මම තවත් වගන්තියක් ඇද දක්වනු කැමැත්තෙමි.

> "පිටත්තර උපකාරයෙන් විරහිතව ජීවත් විය හැකි මාර්ගයක් නැත. අපේම පරිශ්‍රමයෙන් දියුණු කරන ලද අපේම දේශයේ නිපදවන දෑයින් අපේ දියුණුව ඇති කර ගත යුතුය.
>
> "එසේ හෙයින් හොඳම කලාව ගොවිකර්මාන්තය ය: එය හැම ආණ්ඩුවක් විසින් ආරක්‍ෂා කළ යුතුයි. හැම වතු හිමියෙකු විසින් ම ප්‍රගුණ කළ යුතුයි. හැම ස්වභාව ධර්ම විචාරකයකු විසින් ම දියුණු ද කළ යුතු මැයි."— ජොන්සන්.